## කස්තිරම

ඩී බී කුරුප්පු

# පින නම් අලංකාරය

මේ බුදුගුණාලංකාරයෙන් ගත්තක් නොවේ. මගේම පද මාලාවකි. මා එය යොදා ගත්තේ බැණුම් අසන්නට හිතාගෙන ය.

මා ලියූ අන්තිම පොත එනම් -දානයේ ආනිසංස" හුදෙක් ඇමරිකානු ලේඛක යුවලකගේ පොතක් කියවීමෙන් ලද ආස්වාදය පාඨකයා වෙත බෙදා හරිනු වස් ලියැවුණ කෘතියකි. එහි බෞද්ධ හෝ ආගමික යයි කිවහැකි කිසිවක් නැත. දානයෙන් ලැබෙන පින් ගැන කතා කිරීමෙන් පවා වැළකී සිටීමට මම පරිස්සම් වූයෙමි. ඒ ගැන කියන්නට ගිය හොත් බැණුම් අහන්නට සිදුවේය යන සැකය නිසා ය.

මෙහි ඇතුළත් කරන කරුණු සමහරක් වරින් වර මගේ ලිපි වල ඇතුළත් කොට ඇත. එහෙත් මූලික තේමාව එසේ ම ඉදිරිපත් කොට ඇත .

මම අතී.ත අත්දැකීමකින් පටන් ගනිමි. අවුරුදු හයකට උඩ දී වන්දනා නඩයක් සමග දඹදිව ගිය මම අනෙක් අයත් සමග තුන් වතාවක් අටසිල් සමාදන් වූයෙමි. බුද්ධගයා විහාරස්ථානය සාරානාත් සහ සැවැත්නුවර ජේතවනාරාමය යන තුන් පළේ දී. අපේ නඩය සඳහා නඩේ ගුරා විසින් යොදා ගනු ලැබූ විශේෂ කෝකියකු විසින් පිසින ලද මාංශ විරහිත කෑම පමණක් අනුභව කළ අපට අර සිල් ගන්නා දින තුනටම කලින් දා රාත්‍රියට තම්බන ලද බිත්තරයක් දෙන ලදී. එය අනිවාර්ය ලක්ෂණයක් විය. අන් කිසි දිනක බිත්තර නැත .

මේ විශේෂ සත්කාරයට හේතුව මම අද පවා නොදනිමි.

සැවැත්නුවර සිල් ගත් දා රාත්‍රියේ ජේතවනාරාමයේ ගඳකිළිය අබියස හා වටපිටාවේ පවත්වන ලද විසිතුරු පුෂ්ප පූජාවකි. විශේෂයෙන් ගෙන්වා ගත් රතු මල් තොගයට ඉන්දියානු රුපියල් පන්සියයක් හෝ පන්දාහක් වැය වූ බව කියන ලදී. ගඳකිළි බිමත් වටයටත් බිම වැසෙන සේ අතුරණ ලද මලින් සරසා තිබිණ.

ඊළඟට පහන් පූජාවකි. ඒ අවට ගොඩනැගිලි පාදම්වල ගඩොල් මත දල්වා සිටුවන ලද මහා ඉටි පන්දම් සමූහයක්. දහස් ගණනක් වන්නට ඇත. ඉටි පන්දම් දල්වන පිරිසට එකතු නොවී පසෙකට වී බලා සිටි මා වෙත ආ අප සමග සිටි තරුණ හාමුදුරුවෝ මගේ නිහැඬියාව අනුමත නොකරන විදියේ යමක් කීහ. එවිට නම් කට පියා ගෙන නොසිටිය හැකි නිසා මම පිළිතුරක් දුන්නෙමි.

"හාමුදුරුවනේ මේ ගඩොල් පාදම් මතු කරගෙන තියෙන්නේ බොහොම වෙහෙස මහන්සි වෙලා. ඒවා මතු පරම්පරාවටම බලා ගන්න පුද පූජා පවත්වන්න ආරක්ෂා විය යුතුයි. ඒ ආරක්සාව සැළසිය යුත්තේ අප වාගේ මේවා නරඹන උදවියයි. ඒ නිසා ඉටි පන්දමක් පත්තු කරලා හරි ඒවාට හානියක් කරන්න මම සූදානම් නැහැ"

හාමුදුරුවෝ නිහඬ වූහ. ඒත් මගේ ඔලුවේ අමාරුව ගැන හිතා විය යුතු ය.



මා අදත් විශ්වාස කරන්නේ අර විදියට ඉටිපන්දම් දැල්වීමෙන් හා රත්තරන් පාට කොළ ඇලවීමෙන් යට කී පූජනීය පුරාවස්තුවලට හානියක් සිදු වන බව ය. ශ්‍රද්ධාව නිසා එසේ කිරීම අහිතකර බව ය. ඒ කරපු පුෂ්පෝහාරයෙන් එබඳු හානියක් සිදු නොවේ. එහෙත් ඒ ශ්‍රද්ධා ප්‍රකාශයෙන් නොහොත් ප්‍රදර්ශනයෙන් වන සෙතක් මම නොදනිමි. එසේ වැය කරන මුදල පූජ්‍ය ස්ථාන සංවර්ධනයට හෝ සංරක්ෂණයට පරිත්‍යාග කිරීම වඩා හිතකර නොවන්නේ ද?

මා කුඩා අවදියෙන් පසුව මගේ දරුවන් කුඩා අවදියේත් මගේ අම්මා මහත් බැති සිතකින් පවත්වන චාරිත්‍ර විධියක් විය. ඒ විධිය නොහොත් කිරි අම්මලාගේ දානයට ඇය සැරසෙන ආකාරයත් එය ඉටු කරන ආකාරයත් මගේ හිතේ ජනිත කරන ලද්දේ පුදුමාකාර භක්තියකි. ශ්‍රද්ධාවකි. ඒ සිහිපත් කරන විට අද පවා මගේ මව ගැනත් එකී චාරිත්‍ර විධිය ගැනත් ආඩම්බර වන්නෙමි. පසුගිය දා ශ්‍රී ලංකාවේ පත්තරවල ප්‍රචාරය කරන කිරි අම්මාවරුන්ගේ දානයක් ගැන මට ඇති වූයේ එහෙම සැදැහැ හිතක් නොවේ. මිරිසවැටිය අබියසට දහස් ගණනින් කිරි අම්මාවරුන් කැන්දා ගෙන දෙන කිරි අම්මලාගේ දානය හුදු ප්‍රදර්ශනයක් හා ප්‍රචාරක විජ්ජාවක් හැටියට ය මා දකින්නේ.

මාදම්පේ පන්සලක් කරා යන උවැසියන්ගේ පෙරහැරක් මට මතකය. ඔවුන් ගියේ අට පිරිකර සමූහයක් ඔසවාගෙන ය. ඔසවා ගෙන ගොස් මහා අට පිරිකර පූජාවක් පවත්වන්නටය. අට පිරිකර පූජාව නිස්සාර ව්‍යායාමයක් වනුයේ එම පූජා භාණ්ඩයෙන් පලක් ගන්නා කෙනකු නැති හින්දා ය. මට හිතෙන විදියට නම් ඔය පෙරහැර ගිය විහාරස්ථානවාසී භික්ෂූන් වහන්සේලාට සිවුරු පිරිකර කිසිවක් හිඟ පාඩුවක් තිබිය නොහැකි ය. ඒ විදියට අනවශ්‍ය භාණ්ඩයක් සිය දහස් ගණනින් පූජා කිරීම විහිළුවක් නොවන්නේ ද? හුදු ප්‍රදර්ශනයක් පමණක් නොවන්නේ ද?

පසු ගියදාක ශ්‍රී ලංකාවෙන් මෙල්බන් නගරයට සම්ප්‍රාප්ත වූ ප්‍රකට භික්ෂූන් වහන්සේ නමක් ගැන වාර්තා විය. අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියස පිච්ච මල් පූජා පැවැත්වීමේ ප්‍රසිද්ධියක් සහිත උන්වහන්සේ පැමිණියේ මෙහි කිසියම් ස්ථානයක රෝසමල් පූජාවක් පවත්වනු පිණිසය. එය පවත්වන ලද බවත් එයට විශාල පිරිසක් සහභාගි වුණ බවත් සැලවිය.

මෙහෙම දේ ගැන කතා නොකර සිටීම හොඳම ප්‍රතිචාරයයි. එහෙත් ශ්‍රී ලංකාවෙන් මේ රටට වැඩම කළ භික්ෂූන් වහන්සේලා නිරතව සිටින ජාතික හා ආගමික මෙහෙවර ඊට වඩා අභිප්‍රෑවත් ඇති අර්ථාන්විත ක්‍රියාවලියක් විය යුතු ය. ව්‍යායාමයක් විය යුතු ය.

ඒ සියල්ලටම වඩා මෙහි ඉපිද බටහිර සංස්කෘතියේ ආභාසය ලබමින් ඇති දැඩි වන අපේ දරු පරපුර ආගමට දහමට යොමු කරන විදියේ ක්‍රියා විය යුතු ය. දෙමාපියන් කරන කියන දේත් සිතන පතන දේත් විපරමට - විවේචනයට - ලක් කරන නව පරපුරට මේ වගේ විජ්ජා පෙන්වීමෙන් වැඩක් වන්නේ නැත . වයසක උදවියට නම් සැදැහැ සිතින් ඒවාට සම්මාදම් වන්නට ඉඩ ඇත . එහෙත් තව කොච්චර කාලයක් ද?

ශ්‍රී ලංකාවේ සිදු කරන ආගමික ප්‍රචාර ප්‍රදර්ශන වළක්වාලීමට මෙරට වසන අපේ උදවියට බැරිය. එහෙත් මෙහේ කරන මේ වාගේ විජ්ජා පිළිබඳ විහිළුව ඔවුන්ට පවා පෙනී යා යුතු ය.

# ශ්‍රී ලංකාවේ රණවිරුවන්ගේ දරුවනට නිහඬව සේවයක් කරන "විරු දරු දිරිය" අරමුදල

ඕස්ට්‍රේලියාවේ තම ස්ථිර පදිංචිය සඳහා තෝරාගත් විවිධ ජනවාර්ගික කොටස්වලට අයත් සංක්‍රමිකයන් සංඛ්‍යාව අති විශාලය. මොවුනතරින් ශ්‍රී ලාංකික සම්භවය ඇතියවුන් තුළ දක්නට ඇති අද්විතීය ගති ලක්ෂණයක් නම් තම මව්බිම කෙරෙහි දක්වන අසීමිත ආදරය හා සහෝදර රට වැසියන් වෙනුවෙන් කෙරෙන කැපවීමය. ඕස්ට්‍රේලියාවේ විවිධ ප්‍රාන්තවල පිහිටුවා ඇති සමිති සමාගම් වලින් කෙරෙන විශාල මෙහෙය ඊට සාක්ෂි දරයි.

2006 වසරේදී මෙල්බර්න් නගරයේදී පිහිටුවන ලද " විරු දරු දිරිය සංවිධානය" මෙයට කදිම නිදසුනකි. දේශ හිතෛෂී අතලොස්සකගේ අප්‍රමාණ ධෛර්ය හා කැපවීම හේතුවෙන් අද දක්වා මව් රටට ලබා දී ඇති අධාර ප්‍රමාණය අති මහත්ය. මේ කෙටි සටහන එම සංවිධානය වෙනුවෙනි. ස්ථිර සාමාජිකත්වයක් නොමැතිව තනිකරම කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් පාලනය වන සංවිධානයේ කටයුතු ගැන ප්‍රසාදයට පත් දේශප්‍රේමී පුරවැසියන්ගෙන් ගලා එන මුදල් හා වෙනත් ආධාර වලින් අවශ්‍යතාවයන් සපුරා ගැනේ.

ආරම්භයේදීම යුධ හමුදා සේවා වනිතා ඒකකය සමඟ ඇතිකරගත් සුහදතාව මත එකී සංවිධානය මගින් එවකට ආරම්භ කිරීමට සූදානම් කර තිබූ -සෙනෙහස" ව්‍යාපෘතියට ආධාර කිරීමට තීරණය විය. අගනුවර මැනිං ටවුන් ප්‍රදේශයේ දැනට සාර්ථකව පවත්වාගෙන යන මෙම විශේෂ පාසල රණවිරු පවුල් වලින් තෝරාගන්නා ලද මානසික හා ශාරීරික ආබාධ වලින් පෙලෙන දූ දරුවන් සඳහා වෙන්වූවකි.

කුරිරු කොටි ත්‍රස්තවාදයට එරෙහිව යුධ වැදී සිටි රණවිරුවන් සමහරකගේ ගැබිනි භාර්යාවන් මුහුණ පෑ ඉමහත් මානසික පීඩාවන් හේතුවෙන්දෝ එම පවුල් වලින් බිහිවූ දරුවන්




අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් මානසික ආබාධයන්ගෙන් පෙලෙන්නන් බව මේ සම්බන්ධයෙන් කෙරුණු සමීක්ෂණයකදී හෙලිදරව් වී ඇත.-සෙනෙහස" ආරම්භ කිරීමට තුඩුදුන් ප්‍රධාන හේතුව මෙයයි. "සෙනෙහස" වෙනුවෙන් විරු දිරිය මගින් සැපයූ දායකත්වය රුපියල් මිලියන 1.14 කි.

විරු දරු දිරිය මගින් මෙයට සමගාමීව අරඹන ලද මා පිය කැපකරු ව්‍යාපෘතිය මගින් මේ වනවිට රණවිරු දරුවන් 650 ට අධික සංඛ්‍යාවක් වෙනුවෙන් බැංකු ගිණුම් විවෘත කර ආධාර මුදල් සැපයේ. මසකට ඕස්ට්‍රේලියානු ඩොලර් 15.00 බැගින් ත්‍රෛයිමාසිකව දරුවන්ගේ ගිණුම්වලට බැර කෙරෙන මුදල් සැපයෙන්නේ නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ කටයුතු කරමින් විශාල කැපවීමක් කරන දේශප්‍රේමීන්ගෙනි. ඒ අතර එවකට දරුවන් කීප දෙනෙකුටම ආධාර සපයන දේශප්‍රේමීහුද සිටිති. ආරම්භයේ සිට මේ දක්වා රුපියල් මිලියන 11.68 ක මුදල් ආධාර වශයෙන් යැවීමට හැකි වී තිබේ. සංවිධානය වෙත ලැබෙන ආධාර බොහෝමයක් පරිත්‍යාගයන්ය. මීට අමතරව සිංහල චිත්‍රපටි පෙන්වීමෙන්ද " ආහාර රාත්‍රී" සංවිධානය කිරීමෙන්ද, එක්තරා ප්‍රමාණයක ආදායමක් එකතු කිරීමට වාර්ෂිකව ක්‍රියා කෙරේ.

මීට වසර කීපයකට පෙරාතුව ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රදානයද සාර්ථක වී ඇත. මේ සඳහා තෝරාගෙන ඇත්තේ අසාධ්‍ය රෝග වලට ගොදුරු වී රෝහල් ගත වී සිටින රණවිරුවන් කීප දෙනෙකුගේ පවුල් වලින් එක දරුවන් බැගිනි. වාර්ෂිකව රු. 14,400.00 ක් වටිනා මෙම ශිෂ්‍යත්වලාභීන්ගේ ගණන 15කි.

මෙතෙක් ආධාර නොලබන, එහෙත් සුදුසුකම් ඇති දරු දැරියන්ගේ සංඛ්‍යාව 8000 ඉක්මවන බව ගණන් බලා තිබේ. මේ දක්වා මෙවැනි සංවිධානයක දායකත්වය ලබා නොගත් ශ්‍රී ලාංකිකයින් වෙතොත් මේ ඒ සඳහා සුදුසුම අවස්ථාවයි. දැනට සංවිධානය වෙත ලැබී ඇති ඉල්ලුම් පත්‍ර අතරින් තමනට කැමති ප්‍රදේශයක දරුවෙක් හෝ දැරියක් තෝරාගත හැකිය. කැපකරුවන් හා දරුවන් එකිනෙකාට හඳුන්වා දීම, බැංකු ගිණුම් විවෘත කිරීමට උපදෙස් දීම හා යැවෙන මුදල් නිසියාකාරව බැර වෙනවාදැයි නිරතුරුවම පරීක්ෂා කිරීමේ වගකීම කමිටුව හා ලංකාවේ සිටින නියෝජිතයින් විසින් කරනු ලබයි. ඔබේ දරුවන්ගේ උපන්දින උත්සව යනාදිය වෙනුවෙන් නිකරුනේ කෙරෙන වියදම් මෙවැනි මාහැඟි කටයුත්තක් සඳහා යෙදවීම දරුවන් උනන්දු කරවීමෙන් ඔවුන් කරුණාබර යහපත් පුරවැසියන් කිරීමට අතදීම ඔබේ යුතුකමයි. වැඩි විස්තර සඳහා අඅඅගඩසරමෝරමාසරසහ්ගජ්දප වෙබ් අඩවියට පිවිසෙන්න. ඒ හැරෙන්නය පහත නම් දැක්වෙන කමිටු සාමාජිකයින්ද ඇමතිය හැකි ය.

දිනූෂා අමරතුංග 03 9449 0296
නිමල් රාංජකරුණා 03 9800 3965
ආචාර්ය චන්ද්‍රා අතාවුදගේ 03 9700 1040
ආචාර්ය ලංකා ලංකාපුත්‍ර 03 9731 7161
චමත් පියබන්දු 07 3372 6061
ඊමේල් nimal21@bigpond.com

2011 ජූලි මාසය දක්වා විරු දරු දිරිය අරමුදල මගින් ලංකාවේ රණවිරු දූ දරුවන්ට යවා ඇති මුලු මුදල ඩොලර් 138835 කි (රුපියල් මිලියන 13.54 කි)